

මුදල් කොමිෂන් සභාවේ

වාර්ෂික කාර්යසාධනය වාර්තාව - 2021

වැය ශීර්ෂ අංකය 011

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

මුදල් කොමිෂන් සභාව

2022

පටුන

පටුන පිටුව

පරිච්ඡේදය - 01: ආයතනික පැතිකඩ/විධායක සාරාංශය 1

පරිච්ඡේදය - 02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

පරිච්ඡේදය - 03: 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය 14

පරිච්ඡේදය - 04: කාර්යසාධන දර්ශක 25

පරිච්ඡේදය - 05: තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 26

පරිච්ඡේදය - 06: මානව සම්පත් පැතිකඩ 28

පරිච්ඡේදය - 07: අනුකූලතා වාර්තාව 30

පරිච්ඡේදය - 01: ආයතනික පැතිකඩ/විධායක සාරාංශය

1.1. හැඳින්වීම

පසුබිම

වර්ෂ 1987 දී සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ප්‍රකාරව පළාත් සභා ස්ථාපිත කිරීමත් සමඟ මුදල් කොමිෂන් සභාව ද ස්ථාපනය කරන ලදී. පළාත් සභා ස්ථාපිත කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (අ) - 154 (ව) ව්‍යවස්ථාවන් අනුව, පළාත් සභාවන්හි නිසි ක්‍රියාකාරිත්වය උදෙසා පුළුල් පාලන රාමුවක් නිර්මාණය කිරීම පිණිස, 1987 අංක 42 දරණ පළාත් සභා පනත සම්මත කර ගන්නා ලදි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ දක්වා ඇති පළාත් සභා වෙත බලය පවරන ලද විෂයයන්ට අදාළ සේවා සැපයීමේ වගකීම මෙන්ම එම උපලේඛනයේ III වන ලැයිස්තුවේ සඳහන් සමගාමී විෂයයන් පිළිබඳ හවුල් වගකීම් ද පළාත් සභාවලට පැවරේ. පළාත් සභා සඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් මුදල් කොමිෂන් සභාව විසින් සපයනු ලැබේ.

මුදල් කොමිෂන් සභාව හා එහි කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 ජ ව්‍යවස්ථාවෙහි මුදල් කොමිෂන් සභාව ස්ථාපිත කිරීමේ ප්‍රතිපාදන සඳහන් වන අතර, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය ද එහි පැහැදිලි කර ඇත. ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ‘ජ’ (3), (4) හා (5) යන ව්‍යවස්ථාවල සඳහන් පරිදි මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය පහත දැක්වේ.

> 154 ජ (3) ව්‍යවස්ථාව: පළාත් අවශ්‍යතා සපුරාලීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේය.
>
> 154 ජ (4) ව්‍යවස්ථාව: පහත දැක්වෙන කරුණුවලට අදාලව ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවේ වගකීම වේ.
>
> (අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති; සහ
>
> (ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක්,
>
> 154 ජ (5) ව්‍යවස්ථාව: රට තුළ ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කරගැනීම අරමුණු කර කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙළ කළ යුතු අතර ඒ අනුව,
>
> (අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව;
>
> (ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම;
>
> (ඇ) විවිධ පළාත් අතර ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාවය; සහ

(ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර වැඩිම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව, සැලකිල්ලට ගත යුත්තේය.

අතිගරු ජනාධිපතිතුමා වෙත මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ සහිත වාර්තාව ලැබීමෙන් අනතුරුව, එය පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම උදෙසා කැබිනට් මණ්ඩලයට වෙත ඉදිරිපත් කරනු ලැබේ. අනතුරුව 154 'ඡ' (7) ව්‍යවස්ථාවට අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් එකී නිර්දේශ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

මුදල් කොමිෂන් සභාව සිය උපායමාර්ගික සැලැස්ම සකස් කර 2021 සිට 2024 දක්වා කාල සීමාව සඳහා යාවත්කාලීන කර ඇති අතර එම උපායමාර්ගික සැලැස්ම තුළ දැක්ම, මෙහෙවර, ප්‍රමුඛ පරාස සහ අරමුණු හඳුනාගෙන නිර්වචනය කර ඇත.

දැක්ම

තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සහිත සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක්

මෙහෙවර

අරමුදල් බෙදාවෙන් කිරීම පිළිබඳ මූලධර්ම සහ නිර්දේශ ඉදිරිපත් කිරීමත් රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම.

ප්‍රමුඛ පරාස

1. වාර්ෂික අයවැයෙන් පළාත් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම
2. වාර්ෂිකව ලබා දෙන එවැනි අරමුදල් පළාත් අතර බෙදා දිය යුතු මූලධර්ම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම
3. පළාත් මූල්‍යනය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් මුදල් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් එතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

මුදල් කොමිෂන් සභාවේ අරමුණු

1. පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා දීම සඳහා නිර්දේශ කිරීම
2. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අරමුණු කර ගනිමින් පළාත් අතර මූල්‍ය සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම සඳහා වූ නිර්දේශ ඉදිරිපත් කිරීම
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කොමිෂන් සභාවට ලබා දී ඇති වගකීම් සපුරාලීම.

1.3. ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලතල ප්‍රකාරව, මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය වනුයේ රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් පළාත් අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් බෙදා වෙන් කිරීම පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ එවැනි අරමුදල් පළාත් අතර බෙදා දෙන ආකාරය පිළිබඳ ප්‍රතිපත්තිමය නිර්දේශ ජනාධිපතිවරයාට ඉදිරිපත් කිරීමයි.

මෙම ක්‍රියාවලියේදී මුදල් කොමිෂන් සභාව;

I. පළාත් සභාවන් සඳහා අවශ්‍යවන වාර්ෂික අරමුදල් අවශ්‍යතා පිළියෙළ කිරීම සඳහා පළාත් සභාවලට මාර්ගෝපදේශ සැපයීම
II. පළාත් සභා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ප්‍රාග්ධනය සහ පුනරාවර්තන අවශ්‍යතා අර්ථාන්විත පදනමක් මත තක්සේරු කිරීම් හා විශ්ලේෂණය කිරීම
III. ජාතික අයවැයෙන් පළාත් සභාවලට ලබාදිය යුතු ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදාන පිළිබඳව රජයට නිර්දේශ ලබා දීම
IV. පළාත් සභා අතර ප්‍රදාන වෙන් කිරීම පිළිබඳව සහ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිර්දේශයන් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම
V. කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සම්පත් භාවිතය උදෙසා වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී පළාත් සභාවලට සහාය වීම සිදු කරයි.

1.4. කොමිෂන් සභාවේ ප්‍රධාන අංශ

අනිවාර්ය කාර්යයන් සහ මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව යටත් පහත සඳහන් ක්‍රියාකාරී සහ උපකාරක අංශ ක්‍රියාත්මක වේ.

- ප්‍රතිපත්ති, අධ්‍යනය හා වාර්තා කිරීමේ අංශය
- පළාත් සංවර්ධන හා සැලසුම් අංශය
- පුනරාවර්තන අවශ්‍යතා සහ සේවක සංඛ්‍යා තක්සේරු අංශය
- පළාත් ආදායම් අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

මුදල් කොමිෂන් සභාවේ එක් එක් අංශයන්හි කාර්යයන්

මුදල් කොමිෂන් සභාවේ එක් එක් අංශ මගින් සිදු කරනු ලබන විශේෂිත කාර්යයන් පහත දැක්වේ.

a. ප්‍රතිපත්ති, අධ්‍යනය හා වාර්තා කිරීමේ අංශය

1. අදාල අධ්‍යයන සිදු කිරීම සහ අරමුදල් වෙන් කිරීම හා බෙදා වෙන් කිරීමේ මූලධර්ම හඳුනා ගැනීම
2. අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සකස් කිරීමේදී මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට සහාය වීම
3. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සහ කාර්යසාධන වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම

b. පළාත් සංවර්ධන හා සැලසුම් අංශය

1. මුදල් කොමිෂන් සභාවේ නිර්දේශවලට ඇතුළත් කිරීම සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම
2. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම
3. පළාත් සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාවේ එකඟතාවය ලබා දීම

c. පුනරාවර්තන අවශ්‍යතා සහ සේවක සංඛ්‍යා තක්සේරු අංශය

1. පළාත් අතර අරමුදල් වෙන් කිරීම සඳහා වෙන් වෙන්ව පළාත් සභා, පළාත් පාලන ආයතන අනෙකුත් පළාත් ආයතනවල පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම.
2. පළාත්වලට අවශ්‍ය පරිපූරක ප්‍රතිපාදන නිර්දේශ කිරීම.පළාත් සේවක සංඛ්‍යා තක්සේරු කිරීම්
3. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා ජාතික වැටුප් කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කිරීම

d. පළාත් ආදායම් අංශය

1. පළාත් ආදායම් තක්සේරු කිරීම සහ ආදායම් ඉලක්ක සැකසීම
2. පළාත් පාලන ආයතනයන් හි ආදායම් තක්සේරු කිරීම
3. පාර්ශවකරුවන්ට පළාත් ආදායම් පිලිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම

e. පාලන අංශය

1. මුදල් කොමිෂන් සභාවේ දෛනික පරිපාලනමය කටයුතු ක්‍රියාත්මක කිරීම
2. නිවාඩු, රක්ෂණය, අති කාල සහ වෙනත් ගෙවීම්, ප්‍රවාහනය, පුද්ගලික ලිපිගොනු පිළිබඳ කාර්යයන් සහ වත්කම් නඩත්තු කිරීම
3. පුහුණුව හා මානව සම්පත් සංවර්ධනය

f. ගිණුම් අංශය

1. මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීම සහ සකස් කිරීම
2. මූල්‍ය පාලනය සහ තොරතුරු නඩත්තු කිරීම
3. ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම (භාණ්ඩ, භෞතික ක්‍රියාකාරකම් සහ සේවා)

1.5. සංවිධාන සටහන



නි.අ /ස.අ -නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
ප.නි - පරිපාලන නිලධාරී
තො.තා.ස.නි - තොරතුරු තාක්ෂණ හා සංනිවේදන නිළධාරී
ස. නි - සංඛ්‍යාන නිළධාරී

ස.ප.නි - සහකාර පර්යේෂණ නිළධාරී
සං. නි - සංවර්ධන නිළධාරී
රා.ක.ස.නි - රාජ්‍ය කළමනාකරණ සහකාර නිළධාරී
කා.කා.ස - කාර්යාල කාර්යය සහයක

1.6. මුදල් කොමිෂන් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

කිසිදු ආයතනයක් මුදල් කොමිෂන් සභාව යටතේ පිහිටුවා නැති අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මගින් බලය පවරා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා පිහිටුවා ඇති විශේෂ ආයතනයකි (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ ව්‍යවස්ථාව අනුව ස්ථාපිත ස්වාධීන කොමිෂන් සභාවකි)

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) – මුදල් කොමිෂන් සභාව යටතේ එවැනි ව්‍යාපෘති නොමැත.

අ) ව්‍යාපෘතියේ නම
ආ) දායක නියෝජිතායතනය
ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මි.
ඈ) ව්‍යාපෘති කාල සීමාව

} අදාළ නොවේ

පරිච්ඡේදය - 02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

මුදල් කොමිෂන් සභාව, පැවරී ඇති සිය ව්‍යවස්ථාපිත කාර්යයන්ට අනුකූලව පහත සඳහන් ප්‍රධාන ක්‍රියාකාරකම්, 2021 ක්‍රියාකාරී සැලැස්මේ කාල රාමුව තුළ ඉටු කර ඇත.

2.1.1. ප්‍රාග්ධන අයවැය කටයුතු වලට අදාළ ප්‍රගතිය

i. පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරුව පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම

2022 වසර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ 2021 ජනවාරි 15 වන දින පළාත් සභා වෙත යවා ඇත.

ii. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම - 2021

මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව සකසන ලද පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම්(ADPs) සියළු පළාත් සභා විසින් මුදල් කොමිෂන් සභාවේ එකඟතාව සඳහා ඉදිරිපත් කරන ලදී. එම වාර්ෂික සංවර්ධන සැලසුම් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව, සෑම පළාත් සභාවක් සඳහාම පහත සඳහන් පරිදි නියම කර ගත් දිනවලදී සමාලෝචන රැස්වීම් පවත්වන ලදී. මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා, කොමිෂන් සභාවේ සාමාජිකයින් කිහිප දෙනෙක්, ලේකම්වරයා සහ අනෙකුත් අදාළ නිලධාරීන්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන්, වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම වෙනුවෙන් පළාත් තුළ පැවති රැස්වීම් සඳහා සහභාගි වූ අතර, ගරු පළාත් ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අදාළ වගකිවයුතු නිලධාරීන් ද සියලු සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස පළාත් සභා විසින් කරන ලද ඉල්ලීම් මත පදනම්ව, 2021 වසර සඳහා වූ වාර්ෂික සංවර්ධන සැලසුම්වල ඇතුළත් පුළුල් ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් යම් යම් සංශෝධනයන්ට යටත්ව ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාව ලබා දෙන ලදී (එය ලිඛිතව දැනුම් දී ඇත).

පවත්වන ලද වාර්ෂික සමාලෝචන රැස්වීම්වල කාලසටහන පහත දැක්වේ.

රැස්වීම් පැවැත් වූ දිනය	පළාත
08.02.2021	උතුරු මැද
12.02.2021	බස්නාහිර
18.02.2021	ඌව
19.02.2021	මධ්‍යම
01.03.2021	දකුණු
03.03.2021	සබරගමුව
09.03.2021	වයඹ
15.03.2021	උතුරු
16.03.2021	නැගෙනහිර

iii. 2022 වර්ෂය සඳහා පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද පළාත් අරමුදල් අවශ්‍යතා තක්සේරු කිරීම.

ඉදිරි වසර සඳහා පළාත් සභාවල ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම, අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් වේ. එබැවින්, මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව පළාත් සභා වෙතින් ලැබුණු මූල්‍ය අවශ්‍යතා සමාලෝචනය කරන ලදී.

පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද 2022 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා සමාලෝචනය කිරීම පිණිස පහත සඳහන් රැස්වීම්, අදාළ පළාත් බලධාරීන් සමඟ zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලද අතර, එහිදී, ව්‍යාපෘති ද්විකරණය වීම වැළැක්වීම සඳහා සහ අනෙකුත් පළාත් අවශ්‍යතා පිළිබඳ පොදු තීරණවලට එළැඹිණි.

Zoom තාක්ෂණය ඔස්සේ පවත්වනු ලැබූ රැස්වීම්වල කාලසටහන පහත දැක්වේ,

රැස්වීම පැවැත්වූ දිනය	පළාත
07.07.2021	ඌව
08.07.2021	වයඹ
09.07.2021	උතුරු
12.07.2021	නැගෙනහිර
13.07.2021	බස්නාහිර
14.07.2021	මධ්‍යම
15.07.2021	උතුරු මැද
16.07.2021	සබරගමුව
19.07.2021	දකුණු

iv. පළාත් සභාවන්ට වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව දැනුම් දීම

2022 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පතේ අනුමැතියට අනුව, ජාතික අයවැය යටතේ 2022 වර්ෂය සඳහා වෙන් කරන ලද සමස්ත ප්‍රාග්ධන ප්‍රදාන (PSDG – රු. බිලියන 15, CBG – රු. බිලියන 3 සහ විදේශ ආධාර සහිත ව්‍යාපෘතිය - රු. බිලියන 8) පළාත් සභා වෙත දැනුම් දෙන ලදී

2.1.2. පුනරාවර්තන අයවැය කටයුතු වලට අදාළ ප්‍රගතිය

පළාත් සභා විසින් කරනු ලබන ඉල්ලීම් මත පදනම්ව පළාත්වල පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කෙරේ. 2021 වර්ෂයේ දී, පළාත් පුනරාවර්තන අවශ්‍යතා සහ සේවක සංඛ්‍යා තක්සේරු අංශය විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

i. 2022 වර්ෂය සඳහා පුනරාවර්තන අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම

පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ 2021 ජනවාරි 18 වැනි දින පළාත් සභා වෙත යවන ලදී.

මෙම මාර්ගෝපදේශ, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලැබේ. මෙම මාර්ගෝපදේශය, ප්‍රධාන වශයෙන් වැටුප් හා වේතන, අනෙකුත් පුනරාවර්තන වියදම්, පළාත් පාලන ආයතනවලට මාරු කිරීම සහ පළාත්වල ආදායම් ඇස්තමේන්තු මත පදනම් වී ඇත. ඊට අමතරව, ප්‍රදාන සඳහා ඔවුන්ගේ ඉල්ලීම ඉදිරිපත් කිරීමේදී පළාත් විසින් පිරවිය යුතු අදාළ ආකෘති කට්ටලයක් ද යවන ලදී.

ii. 2022 වසර සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම

මාර්ගෝපදේශ සමඟ අමුණා ඇති කාල සටහනට අනුව, පළාත් විසින් ඔවුන්ගේ අවශ්‍යතා ඇතුළත්ව සම්පූර්ණ කරන ලද ආකෘති මුදල් කොමිෂන් සභාව වෙත එවන ලදි. 2022 වර්ෂය සඳහා වන එම පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කරන ලද අතර, ඒ සඳහා, පළාත් ප්‍රධාන ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් සහ අයවැය අධ්‍යක්ෂ ඇතුළු පළාත් සභා නිලධාරීන් සමඟ රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. ජාතික අයවැය දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් ද රැස්වීම් සඳහා සහභාගි වූහ. වසංගත තත්ත්වය හේතුවෙන් සියලුම රැස්වීම් zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

වාර්ෂික පුනරාවර්තන අයවැය සාකච්ඡාවල කාලසටහන පහත දැක්වේ.

සාකච්ඡාව පැවැත්වූ දිනය	පළාත
15.06.2021	බස්නාහිර
16.06.2021	මධ්‍යම
17.06.2021	සබරගමුව
18.06.2021	දකුණු
21.06.2021.	උතුරු මැද
22.06.2021	නැගෙනහිර
23.06.2021	උතුරු
25.06.2021	ඌව
28.06.2021	වයඹ

iii. පළාත්වල පළාත් පුනරාවර්තන අවශ්‍යතා පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම

පළාත් සභා බලධාරීන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, 2022 ජාතික අයවැය සකස් කිරීම සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතා අවසන් තක්සේරුව කර මහා භාණ්ඩාගාරයට යැවීමට පෙර මුදල් කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. පළාත් සභා සඳහා නිර්දේශිත මූල්‍ය ප්‍රතිපාදන වන රු. මිලියන 344,861 (ආදායම් මාරු කිරීම ඇතුළුව) 2021.08.20 දින මහා භාණ්ඩාගාරයට දැනුම් දෙන ලදී.

iv. වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් පළාත්වලට දැන්වීම

මුදල් කොමිෂන් සභාව, ජාතික අයවැය යටතේ වෙන් කළ රුපියල් මිලියන 320,369 ක මුළු පුනරාවර්තන ප්‍රතිපාදනය 2021.11.17 වැනි දින පළාත් සභා වෙත දැනුම් දී ඇත.

v. අමතර ප්‍රතිපාදන නිර්දේශ

පළාත් ඉල්ලීම් මත අමතර ප්‍රතිපාදන අවශ්‍යතා මහා භාණ්ඩාගාරයට නිර්දේශ කරන ලදී. නිර්දේශිත ප්‍රමාණයන් පහත පරිදි වේ.

(රු. '000)

දිනය	පුරප්පාඩු පිරවීම සඳහා අතිරේක ප්‍රතිපාදන නිර්දේශ	රේඛීය අමාත්‍යාංශ විසින් අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩල සඳහා අමතර ප්‍රතිපාදන නිර්දේශය	නව නිර්දේශය	සම්පූර්ණ නිර්දේශය
2021.05.06	3,125,068	447,803	2,030,617	5,603,488
2021.06.10	0	0	215,018	215,018
2021.07.02	101,599	289,948	5,514,096	5,905,643
2021.09.15	46,891	72,068	479,754	598,713
2021.12.08	4,513	180,748	727,202	912,463
2021.12.20	0	0	9,655	9,655
මුළු එකතුව	**3,278,071**	**990,567**	**8,976,342**	**13,244,980**

2.1.3. අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලද නිර්දේශයන්ට අදාළ කරුණු වල ප්‍රගතිය

i. අතිගරු ජනාධිපතිතුමා වෙත යැවීම පිණිස 2022 වසර සඳහා කොමිෂන් සභාවේ නිර්දේශ සැකසීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'ඡ' වගන්තිය අනුව, මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂික අයවැයෙන් පළාත් සභාවලට මුදල් වෙන් කර දීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සඳහා සම්පත් වෙන් කිරීමේ අවශ්‍යතාවය දැඩි ලෙස දැනෙන ප්‍රදේශ/අංශ අවධාරණය කරමින් බලය පවරන ලද විෂයයන් සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම සහ ජාතික මට්ටමේ රේඛීය/රාජ්‍ය අමාත්‍යාංශවලට සාපේක්ෂව පළාත් සභා මුහුණ දෙන විෂමතා ඉවත් කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් වූ 2022 වර්ෂය සඳහා සිය නිර්දේශ අතිගරු ජනාධිපතිවරයා වෙත 2021 ඔක්තෝම්බර් 04 වන දින ඉදිරිපත් කර ඇත. තවද, තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී පළාත්වලට ආවේණික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඒකාබද්ධ සැලසුම් යාන්ත්‍රණයකට අනුගත වීමේ වැදගත්කම කොමිෂන් සභාව විසින් පෙන්වා දී ඇත.

නිර්දේශ අඩංගු වාර්තාව පහත සඳහන් පරිච්ඡේද වලින් සමන්විත වේ,

- පරිච්ඡේදය 1 : හැඳින්වීම
- පරිච්ඡේදය 2 : නිර්දේශ සකස් කිරීමේදී සළකා බලනු ලැබූ ව්‍යවස්ථාමය නියමයන් හා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ හා අනෙකුත් කරුණු
- පරිච්ඡේදය 3 : ජාතික අයවැය සහ පළාත් සභා සඳහා රජයේ ප්‍රදාන
- පරිච්ඡේදය 4 : පළාත් සභා ප්‍රදාන සඳහා ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම
- පරිච්ඡේදය 5 : රජයෙන් ලැබෙන ප්‍රදාන පළාත් සභා අතර බෙදා වෙන් කිරීම පිලිබඳ නිර්දේශ -2022

මෙම පරිච්ඡේදයෙන් ජාතික අයවැයෙන් පළාත් සභා වෙත වෙන් කරනු ලබන ප්‍රාග්ධන අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක පැහැදිලි කර ඇත. ඒ සමගම 2022 වර්ෂය සඳහා පළාත් සභා වෙත මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රදාන පිලිබඳ තොරතුරු දක්වා ඇත.

පවතින මූල්‍ය අර්බුදය සැලකිල්ලට ගනිමින් මුදල් කොමිෂන් සභාව 2022 වර්ෂයට අදාලව පළාත් සභා වෙත ප්‍රාග්ධන ප්‍රදාන විකල්ප 2 ක් යටතේ නිර්දේශ කර ඇත. ඒ අනුව, පළමු විකල්පය යටතේ රු.මී. 220,000 ක් හා දෙවන විකල්පය යටතේ රු. මිලියන 100,000 ක් ප්‍රාග්ධන අරමුදල් ලෙස නිරේදේශ කර ඇති අතර පුනරාවර්තන ප්‍රදානය ලෙස නිර්දේශ කර ඇති මුදල රු. මිලියන 344,861 කි.

- පරිච්ඡේදය 6 : පළාත් මට්ටමින් වඩාත් අර්ථාන්විත ලෙස සම්පත් වෙන් කිරීම හා සම්පත් උපයෝජනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වන නිර්දේශ

  පළාත් සභා වෙත වඩාත් කාර්යක්ෂම ආකාරයට අරමුදල් බෙදා වෙන් කිරීමට අදාලව අතිගරු ජනාධිපතිතුමා වෙත මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්තිමය නිර්දේශ මෙම පරිච්ඡේදයෙහි ඇතුළත් වේ. එම නිර්දේශ මගින් විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතු ප්‍රදේශ හා අංශ සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම හා පළාත් සභා ආයතන හා ජාතික ආයතන අතර දැනට ලැබෙන යම් යම් විෂමතාවයන් ඉවත් කිරීමේ වැදගත්කම පෙන්වා දී ඇත.

  ඉදිරියේදී රජයේ සමස්ත ප්‍රාග්ධන අයවැයෙන් අවම වශයෙන් 20% ක් පළාත් සභා වෙත වෙන් කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත. දිස්ත්‍රික් මට්ටමේ හා පළාත් මට්ටමේ දී ජාතික ව්‍යාපෘති / වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා සතු මානව සම්පත් ඇතුළුව අනෙකුත් සම්පත් ප්‍රශස්ත ලෙස ප්‍රයෝජනයට ගැනීමට හැකිවන පරිදි පළාත් සභා මේ සඳහා සම්බන්ධ කරගැනීමේ වැදගත්කම ද කොමිෂන් සභාව විසින් පෙන්වා දී ඇත. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ළඟා කරගැනීම සඳහා සැලසුම් සකස් කිරීමේදී පළාත් සභා හා ජාතික මට්ටමේ ආයතන එක්ව පොදු හා ඒකාබද්ධ සැලසුම් ක්‍රියාවලියක් අනුගමානය කිරීම ද අත්‍යවශ්‍ය බව කොමිෂන් සභාව අවධාරණය කර ඇත. ඒ තුළින් රාජ්‍ය සම්පත් භාවිතයේ ඒවිකරණය වලක්වා ගනිමින් වඩාත් කාර්යක්ෂම ලෙස එම සම්පත් භාවිත කිරීමට හැකිවනු ඇත. මීට අමතරව, ව්‍යාපෘතිවල ඇස්තමේන්තු සකස් කිරීමේදී පරිපාලන වියදම් වෙන් කිරීමේදී හා ප්‍රතිලාභී දායකත්ව ලබා ගැනීමේදී පළාත් ආයතන හා ජාතික ආයතන අතර ඒකාකාර ක්‍රමවේදයක් ඇති කිරීම අවශ්‍ය බවත්, පළාත් සභාවල නඩත්තු කටයුතු සඳහාත්, අවම අරමුදලක් වෙන් වන කුඩා නමුත් වැදගත්මින් වැඩි අංශ සඳහා මෙන්ම සමජාධාර අවශ්‍ය කණ්ඩායම් සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීමත් අත්‍යවශ්‍ය බව කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

ii. 2022 සඳහා නිර්දේශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අනුමැතිය අපේක්ෂා කරමින් අතිගරු ජනාධිපතිතුමා විසින් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය පිළිබඳ අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2021 නොවැම්බර් 16 වැනි දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. 2021 නොවැම්බර් 29 වැනි දින ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය ඇතුළත් භාෂා තුනෙන්ම සකසන ලද පිටපත් 270 ක් 2021 දෙසැම්බර් 27 වැනි දින පාර්ලිමේන්තුවට යවන ලදී. ඒවා 2022 ජනවාරි 20 වැනි දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

iii. වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2020 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

රාජ්‍ය ආයතනවල වාර්ෂිකකාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව පොදු ආකෘතියක් හඳුන්වා දී ඇත. ඒ අනුව, 2020 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ විගණකාධිපති වාර්තාව ඇතුළු ගිණුම් ප්‍රකාශ අඩංගු වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂා තුනෙන්ම ජනාධිපති ලේකම් කාර්යාලයට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

2.2 විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණු

i. 2022 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය අතිගරු ජනාධිපතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසු පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ii. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, අවශ්‍ය කාර්යයන් ඉටු කිරීම පිණිස උපායමාර්ගික සැලැස්මට (2021-2024) අනුකූලව සකස් කර ක්‍රියාත්මක කරන ලදී.

iii. ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ අදාළ රේඛීය අමාත්‍යාංශ විසින් කරන ලද ඉල්ලීම් අනුව, අවශ්‍ය මාර්ගෝපදේශ කිහිපයක් ලබාදීමට මුදල් කොමිෂන් සභාව කටයුතු කළ අතර, ග්‍රාමීය රෝහල් සංවර්ධනය (රු. මිලියන 5000), පළාත් ආයුර්වේද රෝහල් සංවර්ධනය (රු. මිලියන 320), ග්‍රාමීය ක්‍රීඩා සංවර්ධනය (රු. මිලියන 265.6) , සහ පොදු ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන (රු. මිලියන 830) අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ද එවැනි ජාතික නියෝජිතායතන සහ පළාත් සභා සමඟ සම්බන්ධීකරණය කර ඇත.

iv. ග්‍රාමීය රෝහල් සංවර්ධනය පිළිබඳ අයවැය යෝජනා සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 08 වැනි දින මුදල් කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රධාන ලේකම්වරුන්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් නවයේම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් මූලික රැස්වීමක් සංවිධානය කරන ලදී. ප්‍රතිලාභීන් වෙත සේවාවන් ලබාදීමට හැකිවන පරිදි වෙන්කර ඇති අයවැය සීමාව යටතේ, ක්‍රියාකාරකම් ඉදිරි වසරට අවිච්ඡේද නොකර වත්මන් වර්ෂය තුළ අවසන් කිරීමට හැකි පරිදි ග්‍රාමීය රෝහල් සංවර්ධනය සඳහා සංවර්ධන සැලසුම් සකස් කරන ලෙස පළාත් සෞඛ්‍ය බලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවලට අනුකූලව සකසන ලද ග්‍රාමීය රෝහල් සංවර්ධනය පිළිබඳව සියලුම පළාත් විසින් ඉදිරිපත් කළ අතර, ඒවා ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ ජාතික නියෝජිතායතන සමඟ සලකා බලන ලදී. උක්ත සඳහන් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2021 අප්‍රේල් 27 සිට 30 දක්වා zoom තාක්ෂණය ඔස්සේ සාකච්ඡා මාලාවක් පැවැත්වීමෙන් අනතුරුව, එම සැලසුම්වල සංවර්ධන ක්ෂේත්‍ර සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාව ලබා දෙන ලදී. අනතුරුව, එම නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වැඩසටහනේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා zoom තාක්ෂණය ඔස්සේම රැස්වීමක් 2021 අගෝස්තු 11 වන දින පවත්වන ලදී.

v. මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා, අනෙකුත් අදාළ නිලධාරීන් ද රිදියගම රැඳවුම් නිවාසයේ වත්මන් තත්ත්වය අධ්‍යයනය කිරීම සඳහා 2021 දෙසැම්බර් 15 වැනි දින එහි සංචාරය කළ අතර, ඉදිවෙමින් පවතින අකුරැස්ස විහාරමහාදේවි සහනික ලත් පාසල පිළිබඳව ද සාකච්ඡාවක් පැවැත්විණි. දකුණු පළාත් ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), හිටපු පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයා මෙන්ම පළාත් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස්වරයා සහ දකුණු පළාත් සභාවේ වගකිව යුතු නිලධාරීන් ද මීට සහභාගි වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස රිදියගම රැඳවුම් නිවාසයේ කළමනාකරණය සහ සංවර්ධනය සම්බන්ධයෙන් අදාළ බලධාරීන්ගේ කමිටුවක් හරහා ඉදිරි තීරණ ගන්නා ලෙස අධිකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කෙරුණු අතර, ඒ පිළිබඳ කමිටුවක් පත් කර වැඩිදුර අධ්‍යයනය කිරීමට අධිකරණ අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

2.3 අභියෝග සහ අනාගත දැක්ම

Covid - 19 වසංගතය පැතිරීමත් සමඟ ප්‍රධාන වශයෙන් රට තුළ ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන්, ජාතික හා පළාත් මට්ටමින් සංවර්ධන මැදිහත්වීම් සඳහා තිබෙන අරමුදල් ඉතා සීමිත වී ඇත. එබැවින්, ජාතික සහ පළාත් මට්ටම් අතර තාර්කිකව සම්පත් වෙන් කිරීම වෙන කවරදාකටත් වඩා අභියෝගාත්මක වන බැවින්, හිඟ සම්පත්වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි කොමිෂම සිය ඉදිරි නිර්දේශ ඉදිරිපත් කිරීමේදී වඩාත් තීරණාත්මක ක්ෂේත්‍ර සහ අංශ කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමට සිදුව ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (5) වගන්තියේ මුදල් කොමිෂන් සභාවේ වගකීම් සඳහන් කිරීමේදී, ‘‘තුලිත ප්‍රාදේශීය සංවර්ධනය’’ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් සම්පත් වෙන් කිරීම සඳහා මූලධර්ම සැකසීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. රේඛීය අමාත්‍යාංශවලට තිබෙන සම්පත් හා සසඳන විට (පළාත් සභා වෙත බලය බෙදා හැර ඇති විෂයයන් සඳහා පවා) පළාත් සභාවන්ට ලැබෙන අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, මූලික වශයෙන් පළාත් සභා ක්‍රමය තුළින් පමණක් මෙම අරමුණ ඉටුකර ගත නොහැකි බව කොමිසමේ විශ්වාසයයි. අනෙක් කරුණ නම්, මධ්‍යම ස්ථරයේ (රේඛීය අමාත්‍යාංශ සහ රාජ්‍ය අමාත්‍යාංශ) ආයතනවලට මුළු දිවයිනේම හෝ විශාල භූගෝලීය ප්‍රදේශ වල ප්‍රයෝජනය සඳහා ව්‍යාපෘති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති බැවින්, ප්‍රාදේශීය සංවර්ධනයට එය බෙහෙවින් බලපායි. එබැවින්, රේඛීය අමාත්‍යාංශ/රාජ්‍ය අමාත්‍යාංශවල සැලසුම් ක්‍රියාවලියට ප්‍රාදේශීය සංවර්ධනයේ මානයන් ඇතුළත් කිරීමේ අවශ්‍යතාවක් පවතී. එබැවින්, ‘‘තුලිත ප්‍රාදේශීය සංවර්ධනය’’ සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීමේද, මෙම මානය කෙරෙහි අවධානය යොමු කරමින් පොදු සහ ඒකාබද්ධ සැලසුම් යාන්ත්‍රණයක් අනුගමනය කිරීම සහ පළාත් සභාවන්ට සම්පත් වෙන් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ/රාජ්‍ය අමාත්‍යාංශ සමඟ මෙන්ම වඩා හොඳින් සකස් වූ සැලසුම් යාන්ත්‍රණයක් ඇති පළාත් සභා සමඟ වගකිව යුතු ආයතන (එනම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව) සමීප සහයෝගීතාවයක් ඇති කිරීම අවශ්‍ය වේ. පළාත්/දිස්ත්‍රික්කවල ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා ඉදිරියේදී රේඛීය අමාත්‍යාංශ මගින් මුදල් වෙන් කිරීමේදී, මුදල් කොමිෂන් සභාව සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ප්‍රාදේශීය අසමානතාවය මත පදනම් වූ යම් නිර්ණායක භාවිතා කරමින් සංවර්ධනය කරන් පසුගාමී කලාපවලට මෙම වැඩසටහන් යටතේ සාධාරණ සම්පත් ප්‍රමාණයක් ලැබෙන පරිදි යම් යම් අනුපාත සකස් කළ යුතු බව මුදල් කොමිෂන් සභාව යෝජනා කෙරේ.

පරිච්ඡේදය - 03: 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



ඒසිඒ-එල්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තක්ෂ 2021 රු.	නැවත ගලපන ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		82,912,000	99,860,000	ඒසිඒ-3
-	තැන්පතු		111,280	90,277	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		3,147,581	2,407,511	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**86,170,861**	102,357,788	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**86,170,861**	102,357,788	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**3,087**	42,097	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**86,167,774**	102,315,691	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
67,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	50,811,429	47,212,564	
33,330,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	25,767,969	22,915,267	ඒසිඒ-2(ii)
1,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	707,312	835,772	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
101,530,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**77,286,710**	70,963,603	
	මූලධන වියදම්				
1,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	460,928	-	
7,100,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	6,750,874	15,892,123	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	29,092	116,100	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
9,200,000	**මුළු මූලධන වියදම් (උ)**		**7,240,894**	16,008,223	
	තැන්පතු ගෙවීම්		801,775	12,272,190	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		3,123,765	2,180,042	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**3,925,540**	14,452,232	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		88,453,144	101,424,058	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(2,285,370)**	891,634	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		2,285,370	891,634	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3

1

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	801,008,673	793,432,259
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	9,674,870	9,698,686
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	42,097
මුළු වත්කම්		**810,683,543**	**803,173,042**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		9,665,365	8,998,686
දේපළ පිරියත හා උපකරණ සංචිතය		801,008,673	793,432,259
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	9,505	700,000
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	42,097
මුළු වගකීම්		**810,683,543**	**803,173,042**

පිටු අංක 07 ...සිට ..30.. දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..31..... සිට ..38... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම : ඒ. ටී. එම්. යූ. ඩී. බී. තෙන්නකෝන්	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර : ලේකම්	නම : සන්ධ්‍යා කුමුදිනී කොතලාවල
දිනය : 17/02/2022	මුදල් කොමිෂන් සභාව	දිනය : 17/02/2022

සන්ධ්‍යා කුමුදිනී කොතලාවල
ප්‍රධාන ගණකාධිකාරී
මුදල් කොමිෂන් සභාව
අංක 03, සරණ මාවත, රාජගිරිය

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය නැවත ගලපන ලද 2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	2,727,369	2,382,889
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	82,912,000	99,860,000
අත්තිකාරම් අයකර ගැනීම්	2,633,356	2,054,751
තැන්පතු ලැබීම්	111,280	90,277
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**88,384,004**	**104,387,917**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	76,243,756	69,844,985
සහනාධාර සහ මාරුකිරීම්	707,312	835,771
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	835,092	3,735,127
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	3,087	42,097
අත්තිකාරම් ගෙවීම්	2,593,510	1,779,818
තැන්පතු ගෙවීම්	801,775	12,272,190
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**81,184,532**	**88,509,988**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**7,199,472**	**15,877,929**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	12,330	14,194
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**12,330**	**14,194**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	7,211,802	15,892,123
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**7,211,802**	**15,892,123**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(7,199,472)**	**(15,877,929)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

(රු.'000)

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.02.99	පොලී ආදායම්	-	-	365	-
2003.99.00	වෙනත් ආදායම්	-	-	63	-
2004.01.00	වැන්දඹු හා අනත්දරු අරමුදල	-	-	2,311	-

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

(රු. '000)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	110,730	110,730	84,527	76%
ප්‍රාග්ධන	9,200	9,200	7,240	78.71%

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

(රු. '000)

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(රු. '000)

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	449,009	449,010	-	-
9152	යන්ත්‍රෝපකරණ	84,009	76,433	-	-
9153	ඉඩම්	258,000	258,000	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/FC/2/21/30

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 මැයි 26 දින.

ලේකම්,
මුදල් කොමිෂන් සභාව.

මුදල් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මුදල් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මුදල් කොමිෂන් සභාව
26 MAY 2022

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මුදල් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් හා කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වියදම් අවම වීම හේතුවෙන් එක් පුනරාවර්තන වැය විෂයයක රු.600,000 ක්වූ සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර මූලධන වැය විෂයයන් 02 ක එකතුව රු.600,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. තවත් මූලධන වැය විෂයයක මුළු ප්‍රතිපාදනයෙන් සියයට 97 ක් එනම් රු.970,908 ක් ඉතිරිවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ජ)(4) ප්‍රකාරව කොමිෂන් සභාවේ කාර්යයන් ලෙස පළාත් සඳහා වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදාදීමේ ප්‍රතිපත්ති සහ පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් යොමු කරන ලද කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම දක්වා තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් එම කාර්යයන් සම්බන්ධයෙන් 154 (ජ) (6) ප්‍රකාරව ස්වකීය කාර්ය පටිපාටිය තීරණය කළ යුතු වුවත් එවැන්නක් සකස් කරගෙන නොතිබුණි.

(ආ) 2018 වර්ෂයේ සිට මුදල් කොමිෂන් සභා පනත සකස් කිරීමේ කටයුතු ආරම්භ වී ඇතත් 2021 වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු අවසන් වී නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 07 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

එම්.සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය - 04: කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
ප්‍රාග්ධනය සහ පුනරාවර්තන වියදම් පිළිබඳ අවශ්‍යතා තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කිරීම.	✓		
2022 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් තක්සේරු කිරීම.	✓		
2022 නිර්දේශ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.	✓		
පළාත් සංවර්ධන සැලසුම් සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.	✓		
පළාත් සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම සහ එකඟතාව ලබා දීම.	✓		
කාර්යාලයේ මූල්‍ය හා පරිපාලනය කළමනාකරණය කිරීම.	✓		
වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.	✓		

පරිච්ඡේදය - 05: තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අභිමතාර්ථ දක්වන්න

අභිමතාර්ථ/ අරමුණ	ඉලක්ක	සාක්ෂාත් කරගැනීමේ දර්ශක	මේ දක්වා සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
අදාළ නොවේ					

සටහන: රටෙහි තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් මුදල් කොමිෂන් සභාව පිහිටුවන ලද අතර පළාත් ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම හරහා මෙම කාර්යයට පහසුකම් සැලසීම මුදල් කොමිෂන් සභාව සිදු කරනු ලබයි. එමෙන්ම, පළාත් අතර අරමුදල් වෙන් කිරීම පිළිබඳ නිර්දේශ සැකසීමෙන් හා ඔවුන්ගේ වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී මුදල් කොමිෂන් සභාව පළාත් සභාවලට මග පෙන්වීම සිදුකරයි.

වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශයන් සැකසීමේදී රටේ වර්තමාන සමාජ ආර්ථික සංවර්ධනයට ඉහළ වැදගත්කමක් සහිත සාධක ගණනාවක් කෙරෙහි අවධානය යොමු කර ඇත. තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාව විසින් අත්සන් කර ඇති බැවින් සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDGs) සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇත. එබැවින්, තිරසර සංවර්ධන අරමුණු වලට සමගාමීව පළාත් සංවර්ධන සැලැසුම් සකස් කරනු ලබන අතර එම තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘති සකස් කිරීමට ද මාර්ගෝපදේශ ලබාදී ඇත.

වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී එක් එක් ව්‍යාපෘතිය සඳහා වන තිරසර සංවර්ධන ඉලක්ක සහ අදාළ දර්ශක එම III වෙනි ආකෘති පත්‍රයේ සඳහන් කල යුතු අතර එමගින් වාර්ෂික සංවර්ධන සැලැස්ම තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සමඟ සමපාත වන බව තහවුරු කරනු ලැබේ.

තිරසර සංවර්ධන අභිමතාර්ථ සමඟ සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන බලය බෙදා හරින ලද සහ සමගාමී විෂයන්ට අයත් අංශ 23 ක් යටතේ පළාත් සභා වැඩසටහන ක්‍රියාත්මක කරයි. පහත සඳහන් අංශ සියලුම පළාත් සඳහා පොදු වන අතර පළාත්වල නිශ්චිත අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් වාර්ෂික වැඩසටහන පිළියෙළ කර ඇත. නිසි සාධාරණීකරණයන් සමඟ අදාළ පළාතේ අවශ්‍යතා අනුව අවශ්‍ය වේ නම් අතිරේක අංශ ද ඇතුළත් කළ හැකිය.

* අධ්‍යාපන
* බටහිර වෛද්‍ය
* දේශීය වෛද්‍ය
* ක්‍රීඩා
* පරිවාස හා ළමාරක්ෂණ
* සමාජ සේවා
* සංස්කෘතික හා ආගමික කටයුතු
* සමූපකාර සංවර්ධනය
* පූර්ව ළමාවිය සංවර්ධනය
* පළාත් මාර්ග
* වතු යටිතල පහසුකම්
* ප්‍රවාහන
* නිවාස
* ග්‍රාමීය විදුලිබල සැපයුම
* පළාත් පාලනය
  - පළාත් පාලන මාර්ග
  - ප්‍රජා ජල සැපයුම
  - කසළ කළමනාකරණය
  - වෙනත් සේවා
* ඉඩම් සංවර්ධනය
* වාරිමාර්ග
* කෘෂිකර්මය
* පශු සම්පත්
* මිරිදිය ධීවර
* කුඩා කර්මාන්ත
* සංචාරක කටයුතු
* ග්‍රාම සංවර්ධනය

ඒ අනුව, මුදල් කොමිෂන් සභාව මඟින් සෘජුවම කිසිදු සංවර්ධන කටයුත්තක් ක්‍රියාත්මක නොකරයි. කෙසේ වෙතත්, එය ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන පළාත් සභා සමඟ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

පළාත් සංවර්ධන අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සපයා ගැනීම ප්‍රධාන අභියෝගයක් වන අතර එය පළාත් සභා විසින් තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ ක්‍රියාවලියට සීමාවන් ඇති කරයි. ඒ අනුව අපේක්ෂිත වැඩසටහන් සඳහා අරමුදල් ලබාගැනීමේ හැකියාව සැලකිල්ලට ගත්විට නිශ්චිත වර්ෂයක් තුළ ක්‍රියාත්මක කළ හැක්කේ ඉහළ ප්‍රමුඛතාවන් ලබා දී ඇති ව්‍යාපෘති පමණි. එමනිසා, තිරසර සංවර්ධන අභිමතාර්ථ ලභා කරගැනීම සඳහා ඉහල දායකත්වයක් දක්වන ඇතැම් ව්‍යාපෘති මේ හේතුවෙන් ක්‍රියාත්මක නොවීම බොහෝ විට සිදු වේ.

පරිච්ඡේදය - 06: මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	17	15	02
තෘතීයික	5	3	02
ද්විතියික	46	39	07
ප්‍රාථමික	18	10	08

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

වර්තමානයේදී, මුදල් කොමිෂන් සභාවේ සියලුම ඉලක්ක නියමිත වේලාවට ළඟා කර ගැනීම සඳහා පවත්නා කාර්ය මණ්ඩලය විසින් එහි අනිවාර්ය කාර්යයන් ඇතුළුව සිය කාර්යයන් ඉටු කරනු ලබයි. මෙම ප්‍රයත්නයේ දී මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් පවතින කාල රාමුව තුළ ගුණාත්මක නිමැවුමක් ඇති කිරීම සහ ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීම සඳහා අමතර කාලයන්ද වැඩ කරනු ලබයි.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
භාෂා ප්‍රවීණත්වය (දෙමළ)	03	පැය 200	-	-	දේශීය	දෙමළ භාෂාවෙන් ලිවීම, කියවීම සහ කතා කිරීමේ කුසලතා
උපාය මාර්ගික නායකයින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන	01	දින 18	-	-	දේශීය	කළමනාකරණ හා පරිපාලන කුසලතා වර්ධනය කිරීමට

* පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂය තුළ දේශීය මෙන්ම ජාත්‍යන්තර මානව සම්පත් සංවර්ධන පාඨමාලා සඳහා නිලධාරීන් සහභාගි නොවීය.

පරිච්ඡේදය - 07: අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.6	වෙනත්	කිසිවක් නැත		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		

6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ..		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			

10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ..		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		

15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		

20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

අවසානය.